

ආචාර්ය
**පාලිත ගණේවත්ත**

## සාහිත්‍ය මාසය ගැනයි මේ

මේ සැප්තැම්බර් මාසයයි තවත් සාහිත්‍ය මාසයක් උදා වී ඇත. අපේ මව්බිම තවත් සාහිත්‍ය උත්සවයක් සැමරීමට සැරසේ. සාහිත්‍යධරයන් කිහිප පොලකට දහසින් බැඳි පියලි ලැබෙන්නට ආසන්නය. මෙවරත් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයක් පවත්වනු ඇත. තමන්ගේ පොතක් විකුණාගැනීමට දරදිය අදින දිළිඳු ලේඛකයනට සාහිත්‍ය මාසයේදීවත් තම පොතේ පිටපත් කිහිපයක් විකුණාගැනීමේ සිහිනය සැබෑ වනු ඇති ද?



සාහිත්‍ය සංවාද වැඩ මුළු, සම්මන්ත්‍රණ, උත්සව, රැස්වීම්, ආදියසාහිත්‍යලෝලී සහෘදයන්ගේ මන දොල සැපිරීමට යම් පමණකින්වත් ඉවහල් වනු ඇති ද? වසරකට එක් මාසයකදීවත් මෙවන් සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිවන්නේ සාහිත්‍යය ඉගෙනීමෙන් කෑම වේලක් වත් සපයා ගත හැකි දැයි ජනාධිපතිවරයකු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ රටකය. තම මව්බස පාසල් හා විශ්ව විද්‍යාල විෂය ධාරාවෙන් කලක් ඉවත් කර තිබූ රටකය. කොතරම් ආශ්චර්යයක්ද?

රටක සාහිත්‍ය කලා ප්‍රබෝධයක් ඇති වන්නේ රාෂ්ඨ පාලකයන් දැහැමින් සෙමෙන් රට පාලනය කරන සාමාකාමී යුගයකය යන්න සාමාන්‍ය පිළිතැනීමයි. මේ මතය ස්ථාපිත කිරීමට හේතු කාරක දක්වන උගත්තු හා සාහිත්‍ය විචාරකයෝ ලෝක ඉතිහාසයෙන් මෙන්ම ලංකා ඉතිහාසයෙන් ද සාක්ෂි ගෙන හැර පාති. කෝට්ටේ යුගය සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස සැළකේ. සිංහල සාහිත්‍ය අඹරට සන්දේශ කාව්‍ය නමැති දිදුලන තරු රැස පෑවූයේ



කෝට්ටේ යුගයේ වුවද එකල දේශපාලන සමාජ තත්වය විමසීමේදී පෙනී යන්නේ එකල අවුල් වියවුල් සහිත පාලන යුගයක් බවයි. අපේ මව්බිමේ වර්තමානයේ පවතින දේශපාලන සමාජ තත්වය පිළිබඳ කවර කතාද? බහුතර ජනතාවගේ හද ගැසීමට කන් නොදෙන ඊනියා රාජ්‍ය නායකයෝ ස්වකීය බඩගෝස්තරය ගැන පමණක් සිතති. -තම වර්ගයා- රැක ගැනීම සඳහා රටේ කොටසක් පාවාදීමට අර අඳිති. අහිංසක ජනතාව දිළිඳු බවේ පත්ලටම කිමිදී අඳුරේ අත පත ගාමින් ජීවිතය ගැටගසා ගන්නට අසාර්ථක ප්‍රයත්නයක නිරතව සිටිති. තම පවුල් කුසගිනි නිවන්නට එදා වේල සපුරාගන්නට ජීවන සංග්‍රාමයක යෙදෙන ජනකායක් සාහිත්‍ය කලා රසාස්වාදනයට යොමු වන්නේ කෙසේද? එහෙත් විස්මයට කරුණ නම් පසු ගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ ඇති වී තිබෙන සාහිත්‍ය ප්‍රබෝධයයි. පසුගියදා එස් බී එස් ගුවන් විදුලිය සමග සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වූ ශ්‍රී ලංකා සාහිත්‍ය අනු මන්ඩලයේ සභාපතිවරයා මේ පිලිබඳව වැදගත් අදහස් කීපයක් පළ කළේය. ඔහු පඅවසුවේ පසුගිය වසර තුළ ප්‍රකාශයට පත් වී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මන්ඩලය මගින් ලියාපදිංචි කරන ලද ග්‍රන්ථ සංඛ්‍යාව වසරක් ඇතුළතදී මෙතෙක් පළ කරන ලද වැඩිම ග්‍රන්ථ සංඛ්‍යාව ලෙස වාර්තා තබා ඇති බවයි. අපේ මව්බිම දේශපාලන, ආර්ථික, හා සමාජයීය වශයෙන් ප්‍රපාතයකට ඇද දමන අඥබාල දේශපාලකයන්ගේ විදුෂක පාලනය සාහිත්‍යධරයන්ගේ හදවත් කම්පනය කරන්නේද? ඔවුන්ගේ කම්පිත හදින් නඟින සංවේදී ස්වරයද සාහිත්‍ය නිර්මාණ ලෙසින් බිහිවන්නේ.? වසරක් පාසා පවත්වන සාහිත්‍ය උත්සවයේදී රාජ්‍ය සාහිත්‍ය සම්මාන පිදීම ගැන ද අදහසක් පළ කරන්නට සිතේ. සාහිත්‍යධරයන්ගේ සේවාව අගයමින් සම්මාන ප්‍රදානය උත්කෘෂ්ඨ කාර්යයකි. ස්වකීය ශ්‍රමයන් ජීවිත පිරිඥාණයත් පොදු ජන සුව සෙත පිණිස යොදවමින් නිර්මාණකරණයේ යෙදෙන ඔවුනට පුදන ගෞරවයකි. ඔවුන්ගේ සද්කාර්යයට උපහාර පිදීමකි. සාහිත්‍ය කලා නිර්මාණකරණයෙහි ලා ආධුනිකයන් ධෛර්යමත් කරන්නකි. පොදුජන සාහිත්‍ය ලෝලීන් සාහිත්‍ය නිර්මාණකරුවන් සමග පවතින සබඳතාව තහවුරු කරන්නකි.

රාජ්‍ය සාහිත්‍ය සම්මාන පිදීම පිළිබඳව විවිධ මතභේද බොහෝවිට මතුවන්නේ සම්මාන ප්‍රදානය සඳහා කෘතීන් තෝරා ගැනීමේ දී ය. කෘතීන් තෝරා ප්‍රසිද්ධ කිරීමෙන් පසුව ඒ තෝරා ගැනීම් පිළිබඳව විදග්ධ ලේඛක පාඨක සමූහය පළ කරන අදහස් තුළින් ය. රාජ්‍ය සම්මාන සඳහා සඳහා කෘති තෝරා ගැනීම සාධාරණත්වයෙන් හෝ ප්‍රමිතියකින් තොරව සිදු කරන්නක් යයි ඇතැමුන්ගේ අදහසයි. මේ අදහස් කොතරම් දුරට සත්‍ය දැයි කිව නොහැකි ය. කෘතීන් තෝරන සාහිත්‍ය අනුමණ්ඩලයේ සාමාජිකයන් ගේ හිතවතුන්ට සම්මාන ලබාදෙන බවත් අනු මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාලනයෙන් තොරව දේශපාලකයන්ගේ බලපෑම් මත ග්‍රන්ථ තෝරා සම්මාන දීම සිදුවන බවත් කියැවේ. මේ විවේචනවල සත්‍යතාව ගැන කීමට තරම් වැටහීමක් මට නැත.

රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානය ගැන වරක් අදහස් දැක්වූ ගුණදාස අමරසේකර ශූරීන් කියා සිටියේ පොතකට සාහිත්‍ය සම්මානයක් හිමි නොවීමම එය හොඳ පොතක් වශයෙන් පිළිගැනෙන අගනා සාක්ෂියක් බවය.

පසුගිය දශක දෙක තුළ සාහිත්‍ය සම්මාන ප්‍රදානය ගැන සොයා බැලීමේ දී පෙනී යන්නේ එකම ලේඛකයාට කිහිපවරක් (වසර කිහිපයකදීම) රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානය කර ඇති බවයි. මෙය ඇතැම් සාහිත්‍යධරයන්ගේ නොසතුටට හේතු වී ඇති බව ජනමාධ්‍ය මගින් ඔවුන් දක්වන අදහස් වලින් පෙනී යයි. එක් වරක් සම්මානයක් ලැබූ ලේඛකයෙකුට තව දුරටත් සම්මාන දීමෙන් වැළකි සිටීමට සාහිත්‍ය අනුමණ්ඩලයට හැකියාවක් තිබේද? එය සම්මාන ලැබීමට සුදුසු තවත් ලේඛකයන්ට අවස්ථාව ලබාදීමක් නොවන්නේද? විවිධ ක්ෂෙත්‍ර වල වසරේ පළ වූ හොඳම පොත තේරීමේදී කලින් සාහිත්‍ය සම්මාන නොලද ලේඛකයන් පමණක් සළකා බැලීමේ හැකියාවක් තිබේද? එසේ සළකා බැලීමේදී බොහෝවිට සම්මාන ප්‍රදානයට සුදුසු පොත් සොයාගැනීම දුෂ්කර වනු ඇත්ද? සම්මාන ප්‍රදානය සඳහා ග්‍රන්ථ තෝරා ගැනීමේදී කිසියම් ප්‍රමිතියකට අනුව කෘතින් අගැයීමට ලක් කළ යුතු බව රහසක් නොවේ. මෙම ප්‍රමිති මට්ටමට සරිලන කෘතීන් අදාල වසර තුළ පළවී නැත්නම් එම සම්මානය ඒ වසෙර තුළ ප්‍රදානය නොකර සිටිය හැකි නොවේද? මේ විකල්ප යෝජනාව කෙරෙහි ශ්‍රී ලංකා සාහිත්‍ය අනුමණ්ඩලයේ අවධානය යොමු වේ දැයි මම නොදනිමි. ■




දිනක් අන්දරේගේ බිරිඳ අන්දරේ සමග අමනාප වුණා. අන්දරේ සමඟ කිසිම ඇයි හොඳයියක් නැතුව බිරිඳ තමන්ගේ පාඩුවේ ඉන්නා විට අන්දරේ මෙන්න මෙහෙම තම බිරිඳට කවියක් කිව්වා.

එක් වනදාට උක් දණ්ඩේ පැණි — සේමා
වෙන් වුණ දාට යක් දෙබරේ වද — සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග — සේමා
ඉතින් ලඳේ කරවිල තිබ්බටු — සේමා

**ශ්‍රීධර බුවනෙක**

We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
*Immigration Lawyer*

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002